රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි 3000 ස්ථලය
පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්
HIS 3102 - ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංස්කෘතික ඉතිහාසය (16 වන සියවසේ සිට 1948 දක්වා)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය පැය 03

---

01. "තත්කාලීන යුරෝපයේ ආගමික බලවේගවල බලපෑම පෘතුග්‍රීසීන් ලංකාවේ අනුගමණය කළ ආගමික ප්‍රතිපත්තියේ ස්වරූපය හැඩගැස්වීමෙහි ලා තීරණාත්මක ලෙස බලපෑවේය." සාකච්ඡා කරන්න.

02. "පහතරට පැවති සාම්ප්‍රදායික ආර්ථික ව්‍යුහය උපයෝගී කර ගනිමින් පෘතුග්‍රීසීහු ස්වකීය ආර්ථික අපේක්ෂා සපුරා ගත්හ." විමසන්න.

03. "වාණිජවාදී ආර්ථික ක්‍රමයක් ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීමෙහි ලා ලන්දේසි පාලකයන් පුරෝගාමී විය." විමසන්න.

04. "දේශීය සංස්කෘතියේ ආරක්ෂකයන් ලෙස ගණින්ලාන්සේලා කටයුතු කළහ." ලන්දේසි පාලන සමයෙහි ගණින්ලාන්සේලා පහතරට ප්‍රදේශ වල ඉටුකළ සේවය ඇසුරින් මේ කියමන පරීක්ෂා කරන්න.

05. "වැලිවිට සරණංකර සංඝරාජ හිමියෝ උඩරට සංඝ ශාසනික හා ධර්ම ශාස්ත්‍රීය කටයුතු ප්‍රබෝධමත් කිරීමට සමත් වූහ." විමසන්න.

06. "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ක්‍රමය ධනවාදී මුහුණුවරක් වෙත යොමු කිරීමට ගත් උත්සාහයකි." 1833 කෝල්බෘක් - කැමරන් ප්‍රතිසංස්කරණ ඇසුරෙන් මෙම කියමන පරීක්ෂා කරන්න.

07. 19 වන සියවස මුල්භාගයේ ඇති වූ ව්‍යාවසායන කටයුතු නිසා උඩරට සමාජයේ ඇති වූ වෙනස්කම් ප්‍රමාණ කරන්න.

08. ජනපද ව්‍යාපාර ඇතිකිරීමේ අරමුණු මෙනවාදැයි පැහැදිලි කොට ඒවා කොතෙක් දුරට ඉටුවී දැයි පරීක්ෂා කරන්න.

@@@@@@@@@@@@@